චක්‍රලේඛ අංකය : 03/2025

WPCEC/MA 01/චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප)
අංක 628, ජන ජය සිටි ගොඩනැගිල්ල
8 වන මහල , නාවල පාර,
රාජගිරිය.
2025.02. 21

බස්නාහිර පළාතේ
සියළුම වි.සේ.ස සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති,
සභාපතිවරුන් වෙත.

**සමූපකාර සමිති වල සේවය කරනු ලබන ස්ථිර නොකරන ලද සේවකයින් සම්බන්ධයෙන් කටයුතු කිරීම**

බස්නාහිර පළාත් සමූපකාර සමිති වල සේවය කරනු ලබන තාවකාලික හෝ අනියම් හෝ දෛනික හෝ පදනම මත සේවය කරනු ලබන සේවකයින්ගේ සේවා කාල පරිච්ඡේද සම්බන්ධයෙන් සමූපකාර සමිති විසින් කාර්ය පරිපාටි සංග්‍රහයේ 1 වැනි පරිච්ඡේදයේ 8.2 හා 8.3 වගන්ති වල උපදෙස් පරිදි කටයුතු කල යුතු වේ.

02. එහෙත් ඉහත විධිවිධාන නොතකා සමිති විසින් කටයුතු කරනු ලබන බව කොමිෂන් සභාවට අනාවරණය වී ඇති බැවින් සේවා කාල ඉක්මවන ඉහත සේවකයන් 2025.04.15 දිනෙන් පසු තවදුරටත් සේවයේ නොයෙදවිය යුතු බව අවධාරනය කරමි. මෙලෙස සේවය කරනු ලබන සේවකයින්ගේ සේවය තව දුරටත් සමිතියට අත්‍යාවශ්‍ය වන්නේ නම් පමණක් සේවා කාලය මාස 06 සම්පූර්ණ වන සේවකයන් අවම වශයෙන් සති දෙකක සේවා බණ්ඩනයකට යටත් කර ඉන් අනතුරුව කොමිෂන් සභා කාර්ය පරිපාටි සංග්‍රහයට අනුකූල ලෙස නැවත නව බඳවා ගැනීමක ආකාරයෙන් තාවකාලික හෝ අනියම් පත්වීමක් ලබා දීමට සමිතියට කටයුතු කල හැක.

03. ඉහත විධිවිධාන නොතකා සමිති සේවයේ යොදවා ගන්නා අනියම් හෝ තාවකාලික හෝ දෛනික සේවකයින්ට කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් නීතිමය අධිභාරයක්ද සහිතව සිය පෞද්ගලික මුදලින් පියවීමට වන වගකීම සමිති සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය /කාරක සභාව වෙත පැවරෙනු ඇත.

04 . තවද 10/2024 චක්‍රලේඛය යටතේ 2023.12.31 දිනට සුදුසුකම් සපුරා ඇති හා ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති ප්‍රාථමික ශ්‍රේණි වලට අයත් මෙතෙක් ස්ථිර නොවූ සේවකයින් ස්ථිර කිරීම සම්බන්ධයෙන් කටයුතු දැනටමත් සිදු කෙරෙමින් පවතින බවද වැඩිදුරටත් දන්වමි.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත් :1. ලේකම්, පළාත් මාර්ග , ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) - කා.දැ.ගැ.පි
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප) - කා.දැ.ගැ.පි